# මූලික ප්‍රකාශය

## ශ්‍රී ලංකා ජනාධිපතිවරණය 2005

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ ප්‍රධාන නිරීක්ෂක ජෝන් කුෂ්නාහන් විසින් 2005 නොවැම්බර් මස 19 වැනි දින කොළඹ දී ඉදිරිපත් කරන ලදී.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ මූලික ප්‍රකාශයේ සාරාංශය

- මැතිවරණය පැවැත් වූ දිනයේ දී දකුණේ එය සෑහීමකට පත්විය හැකි ආකාරයට ක්‍රියාත්මක වූ අතර 2004 ට වඩා එය වර්ධනයකි. කෙසේ වෙතත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ බලකිරීම මත සිදු වූ වර්ජනය නිසා ඇති වූ ප්‍රචණ්ඩත්වය මත උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ඡන්දය ප්‍රකාශ කිරීමට බාධා එල්ල වූ අතර එහි ප්‍රතිඵලය වූයේ බොහෝ ප්‍රදේශවල ඡන්ද දායකයින්ගේ සහභාගිත්වය ඉතා අවම මට්ටමක පැවතීමයි.
- මැතිවරණ සඳහා වූ නෛතික රාමුව ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ පැවැත්වීමටත් එම ක්‍රියාවලියේ විනිවිදභාවය රැකීමටත් ප්‍රමාණවත් පදනමක් සපයයි. කෙසේ වෙතත් නොවැම්බර් 10 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණයේ අන්තර්වාර නියෝගය එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවල ඡන්ද දායකයන් කෙරෙහි ඇත්ත වශයෙන් ම වෙනස් ආකාරයකට සැලකීමක් සිදුකර ඇත.
- යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ නිරීක්ෂණය වූයේ මැතිවරණ ව්‍යාපාරය සඳහා රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කළ බවයි.
- සමස්ථයක් වශයෙන් ගත්විට මාධ්‍ය මගින් විවිධ වූ දේශපාලන මතවාද මාලාවක් ඉදිරිපත් කළ අතර ඡන්දදායකයන්ට පක්ෂ හා අපේක්ෂකයන් සන්සන්දනය කොට මැතිවරණ දිනයේදී වඩා දැනුවත් තෝරාගැනීමක් සිදුකිරීමට අවස්ථාව ලබා දී තිබිණි.
- රජයේ මාධ්‍ය තමන්ගේ මැතිවරණයට අදාළ ආවරණයන්හි දී සමබර හා අපක්ෂපාතී වාර්තාකරණයක් සිදු කිරීමේ වගකීම ඉටු කර නැත.
- ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීම නිවැරදිව යාවත්කාලීන කිරීම ගැටළු සහගත විය.
- සමස්ථයක් වශයෙන් ගත්කල මැතිවරණ ක්‍රියාවලිය වෘත්තීමය හා අපක්ෂපාතී ඉතා අපහසු අවස්ථාවන්හි දී නිරන්තරව වැඩකරන හොඳින් පුහුණු කරන ලද කාර්ය මණ්ඩලයක් මගින් සිදු කරන ලදී.

## හැඳින්වීම

නොවැම්බර් 17 දින පැවැත් වූ ශ්‍රී ලංකා ජනාධිපතිවරණය පිළිබඳ යුරෝපීය සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ මූලික සොයාගැනීම් පිළිබඳව මෙම ප්‍රකාශය නිකුත් කරයි.

ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතාගේ ආරාධනයක් අනුව යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ සේවය ලබා ගන්නා ලදී. යුරෝපා කොමිසම හා ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මෙම වාර්තාව මැතිවරණය සඳහා සූදානම් වීම, මැතිවරණ ව්‍යාපාරය හා මැතිවරණ දිනය පිළිබඳව සති තුනකට වැඩි කාලයක් හර කණ්ඩායම් සාමාජිකයන් 7 දෙනෙක්ගේ නිරීක්ෂණයන් ද සති 2 ට වඩා වැඩි කාලයක් රට පුරා යොදාගත් දිගුකාලීන නිරීක්ෂකයන් 22 කගේ හා දින 7 පුරා යොදා ගත් කෙටි කාලීන නිරීක්ෂකයන් 51 දෙනෙකුගේ ද නිරීක්ෂණ මත පදනම් විය. මෙම නිරීක්ෂකයන් යුරෝපා සංගමයේ සාමාජික රටවල් 21 හා ස්විස්ටර්ලන්තයෙන් ලබාගන්නා ලදී. නිරීක්ෂකයෝ මැතිවරණ දිස්ත්‍රික්ක 22 සිට වාර්තා කළහ. යුරෝපා සංගමය ශ්‍රී ලංකාව පුරා මධ්‍යස්ථාන 70 ක ඡන්දය ගණන් කිරීම ද නිරීක්ෂණය කරන ලදී.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම පශ්චාත් මැතිවරණ තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා දෙසැම්බර් මස 04 වන තාක් මෙහි රැඳී සිටිනු ඇත. අවසන් වාර්තාවක් පසු අවස්ථාවකදී නිකුත් කරනු ඇත.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ සොයාගැනීම තක්සේරු කරන ලද්දේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948) හා සිවිල් හා දේශපාලන අයිතිය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය හි (1966) සඳහන් ආකාරයට සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් පදනම් කරගෙනය.

## මැතිවරණ කළමනාකරණ මණ්ඩලය මගින් පෙන්වා ඇති අපක්ෂපාතීත්වයේ ප්‍රමාණය

ඡන්ද කොමසාරිස්වරයා කෙරෙහි රටේ දේශපාලන පක්ෂවල විශ්වාසය තිබූ අතර ඔහු මනා ලෙස ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයෙකි. දේශපාලන පක්ෂ සමඟ ඔහු පැවැත් වූ රැස්වීම්, මැතිවරණ පරිපාලනයේ විනිවිද බව හා පොදු විශ්වාසය වැඩි කරමින් ජාත්‍යන්තර හා දේශීය නිරීක්ෂකයන්ට විවෘත විය. බොහෝ තේරීම් භාර නිලධාරීහු ද එම ප්‍රවේශය ම භාවිතා කළහ.

එහෙත් අවාසනාවන්ත කාරණය වන්නේ 17 වැනි සංශෝධනය පිළිගෙන වසර 4 ක් ඉක්ම ගිය පසුවත් ඉතා කනගාටුදායක ලෙස ජනරජයේ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායක සභාව අවලංගු වීමට පෙර නව ස්වාධීන මැතිවරණ කොමිසමක් පිහිටුවීමට නොහැකි වීම නිසා එය ස්ථාපිත කිරීම ප්‍රමාද වීමයි. 17 වැනි සංශෝධනයේ සඳහන් කර ඇති පරිදි මැතිවරණ කොමිසම පත්කිරීම මගින් සැලකිය යුතු ප්‍රමාණයකින් මැතිවරණ නිලධාරීන් කාර්යක්ෂම හා ස්වාධීන ආකාරයට ක්‍රියාකිරීමේ හැකියාව ශක්තිමත් කිරීමේ හැකියාවක් තිබිණි.

කෙසේ වෙතත් වර්තමාන ඡන්ද කොමසාරිස්වරයාට අනාගත මැතිවරණ කොමිසමේ බලතල යොදා ගැනීමේ හැකියාව පවතියි.

ඡන්ද කොමසාරිස්වරයා මැතිවරණය සඳහා තාක්ෂණිකව සූදානම් වීම සඳහා වූ සියලුම නෛතික වශයෙන් වූ නියමිත කාලයන් ලබා ගත්තේය. දිස්ත්‍රික්ක මට්ටමේ දී තේරීම් භාර නිලධාරීන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලයට මනා ලෙස සංවිධානය වීමටත් මැතිවරණය සඳහා සූදානම් වීම හා කළමනාකරණය මනා පරිදි පවත්වාගෙන යාමත් තක්සේරු කරන ලදී. මැතිවරණ හා ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ඉතා සංවිධානාත්මකව හා ධනාත්මක ආකාරයට සිදුකළ බවට තක්සේරු කරන ලදී.

**මැතිවරණවලට පෙනී සිටීමේ හා මැතිවරණ ව්‍යාපාර පැවැත්වීමේ නිදහස**

ජනාධිපතිවරණය සඳහා තරඟකිරීමට අයදුම්පත් භාරදුන් අපේක්ෂකයන් 13 දෙනාගේම නාම යෝජනා භාරගත් අතර ඉදිරිපත් වීමේ අයිතිය සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් නොවිණි.

දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය මගින් පාලනය කරන උතුරු නැගෙනහිර ප්‍රදේශ හැරුණ විට අපේක්ෂකයන්ට ඡන්දදායකයින් හමු වී තම දේශපාලන ස්ථාවරත්වය ප්‍රකාශ කරමින් නිදහසේ මැතිවරණ ව්‍යාපාරයෙහි යෙදීමට අවස්ථාව ලැබුණි.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම නිරීක්ෂණය කළ දස දහස් ගණන් ආධාරකරුවන් සහභාගි වූ රැස්වීම් 28 දීම කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් දක්නට නොවීය. පොස්ටර් ප්‍රදර්ශනය කිරීම ඉතා සීමිත ස්ථාන කිහිපයකට පමණක් නීතිය මගින් සීමා කොට තිබීම නිසා දේශපාලන පක්ෂ තම පක්ෂ කාර්යාල තම පෝස්ටර් ප්‍රදර්ශනය කළ හැකි ස්ථාන වල පිහිටුවීමේ ඉතා නිර්මාණශීලී ප්‍රවේශයකට අවතීර්ණ වී සිටියහ. ප්‍රායෝගික වශයෙන් අපේක්ෂකයා හා තොරතුරු ගෙනයාමේ ව්‍යාපාරයේ ප්‍රධාන මූලාශ්‍රය වූයේ මාධ්‍යයයි.

2004, 2000 හා 2001 වසරවලට සාපේක්ෂව පූර්ව මැතිවරණ ව්‍යාපාරයේදී අඩු ප්‍රචණ්ඩත්වයක් වාර්තා වුව ද මැතිවරණ ව්‍යාපාරයේ අවසන් දින කිහිපය තුළ ප්‍රචණ්ඩත්වය වර්ධනය වීමේ මට්ටමක් පෙන්නුම් කෙරිණි. කුරුණෑගලදී නොවැම්බර් 14 දින එක්සත් ජාතික පක්ෂ නිලධාරියෙකුගේ නිවසකට අත්බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන ලදී. ඊලාම් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි (ඊ.පී.ඩී.පී.) නිලධාරීහු අවස්ථා හතරක දී ඝාතන ඉලක්ක බවට පත් වූ අතර ත්‍රිකුණාමලයේ දී (ඔක්තෝබර් 6), පොතුවිල් (ඔක්තෝබර් 10) හා මැතිවරණ ව්‍යාපාරයේ අවසාන දින කිහිපය තුළ කොළඹ දී නිලධාරීන් තිදෙනෙක් ඝාතනය කිරීම හා යාපනයේදී හතරවන පුද්ගලයා ඝාතනය කිරීමට උත්සාහ කිරීම මෙහි අවසන් ප්‍රතිඵලය විය.

**මැතිවරණය සඳහා රාජ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමේ සාධාරණත්වය**

මැතිවරණ ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය සම්පත් අයුතු ලෙස පරිහරණය කරන බවට පැමිණිලි 10 (සියල්ල එ.ජා.ප.යෙනි) හා රාජ්‍ය නොවන සංවිධානවලින් වාර්තාවන් ද යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම වෙත ලැබුණි. මෙම වාර්තාවල විශේෂයෙන් සඳහන් වූයේ බලධාරීන් විසින් රජයට අයත් වාහන නීති විරෝධී ලෙස භාවිතා කිරීමත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ව්‍යාපාර කටයුතුවලට යොදා ගැනීමත්ය. බොහෝ අවස්ථාවල යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම සෘජුවම නිරීක්ෂණය කළ එක්දෙයක් වන්නේ රජයේ හා පෞද්ගලික පුවත්පත්වල පළවූ මැතිවරණ දැන්වීම් මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණය ප්‍රවර්ධනය කිරීමේ පැහැදිලි අරමුණ සහිතව රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත මණ්ඩල මගින් අනුග්‍රහය දැක්වූ බවයි. යුරෝපීය සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම සෘජුවම නිරීක්ෂණය කළ තව කාරණයක් වන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැතිවරණ ව්‍යාපාරයේ අවශ්‍යතා සඳහා රජයේ බස් භාවිතා කිරීමයි.

**මැතිවරණ පැමිණිලි**

මැතිවරණ දිනය වනවිට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව පැමිණිලි 191 ක් මැතිවරණ කොමසාරිස්වරයාට ලැබී තිබුණි. මෙම පැමිණිලි වලින් 159 එ.ජා.ප. ය ඉදිරිපත් කර තිබුණි. බොහෝ පැමිණිලි ප්‍රමාණයක් (77) රජයේ සම්පත් අයුතු ලෙස පරිහරණය කිරීමට අදාළවත්, විශේෂයෙන් ම මැතිවරණ ව්‍යාපාරය සඳහා රජයේ වාහන අයුතු ලෙස පරිහරණය (46) කිරීමත් සම්බන්ධයෙන් විය. යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමෙහි නිරීක්ෂකයන්ට මැතිවරණ ව්‍යාපාරය සඳහා පොදු ප්‍රවාහන සේවය අයුතු ලෙස ප්‍රයෝජනයට ගන්නා අවස්ථා කිහිපයක් නිරීක්ෂණය කිරීමට හැකිවිය. ඊට අමතරව රජයේ නිලධාරීන් නීත්‍යානුකූල නොවන ආකාරයට මාරු කිරීම හා පත් කිරීම පිළිබඳ පැමිණිලි 24 ලැබුණි. පැමිණිලි 30 ක් ප්‍රචණ්ඩත්වය, ඡන්ද දායකයන් බිය වැද්දීම හා අයුතු බලපෑම් සම්බන්ධයෙන් විය.

මැතිවරණ කොමසාරිස්වරයා මෙම පැමිණිලි නියමිත කාලය තුළ දී අවශ්‍ය කටයුතු කිරීම සඳහා අදාළ බලධාරීන්ට යොමු කළ ද මෙම පැමිණිලි සම්බන්ධ පසු විමරම් කිරීම සඳහා ක්‍රියාකරන ලද බව තහවුරු කිරීමේ කිසිඳු යාන්ත්‍රණයක් ස්ථාපිත කොට නොතිබුණි.

**<u>දේශපාලන පක්ෂ සන්ධාන හා අපේක්ෂකයන්ට මාධ්‍යට ප්‍රවේශ වීමේ සාධාරණත්වය</u>**

**දළ විශ්ලේෂණයක්**

සමස්ථයක් වශයෙන් ගත් කල, මාධ්‍ය මගින් ඡන්ද කොට්ඨාශයකට විවිධ වූ දේශපාලන මතවාද මාලාවක් ඉදිරිපත් කළ අතර එමගින් ඡන්ද දායකයන්ට එම පක්ෂ හා අපේක්ෂයන් සසඳා බලා වඩා දැනුවත් තීරණයක් මැතිවරණ දිනයේ දී ගැනීමේ හැකියාව ලැබිණි. රජයේ රූපවාහිනිය හා

ගුවන් විදුලිය සියලුම අපේක්ෂකයන්ට තම ඡන්ද කොට්ඨාශය වෙත තම වැඩ පිළිවෙල ඉදිරිපත් කිරීම සඳහා නොමිලේ විකාශ කාලය ලබා දෙන ලදී.

පෞද්ගලික හා රාජ්‍ය මාධ්‍ය යන දෙවර්ගයම පක්ෂ මත දැඩි ලෙස අන්තගාමී පිළිවෙතක් අනුගමනය කරමින් දැඩි ලෙස අගමැතිවරයාට (මහින්ද රාජපක්ෂ) හෝ ප්‍රධාන විපක්ෂයේ අපේක්ෂක (රනිල් වික්‍රමසිංහ) මහතාට තම සහාය ලබාදුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සත්‍ය වශයෙන් ම නිදහස් මාධ්‍යයක අඩුව රටවැසියන්ට අපේක්ෂකයන් ගේ මැතිවරණ ව්‍යාපාරය තක්සේරු කිරීමේ හැකියාවට බාධාවක් විය.

එසේ වුව ද, මැතිවරණ කොමසාරිස්වරයාට ඕනෑම ගුවන් විදුලි හෝ රූපවාහිනී ප්‍රචාරයන්ට අදාළ වන පරිදි හෝ විකාශනය මෙහෙයවන්නාට හෝ ඕනෑම හිමිකරුවෙකුට හෝ ප්‍රකාශකයෙකුට බලපාන පරිදි මෙහෙයුම් නිර්ණායකයන් නිකුත් කළ හැකි වුවද (2005 ඔක්තෝබර් 7 ඔහු සිදු කළ පරිදි) එම නිර්ණායකයන් සත්‍ය වශයෙන් ම ක්‍රියාත්මක වනවා ද යන්න අධීක්ෂණය කිරීම සඳහා ඔහු සතුව සම්පත් නොමැත.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අධීක්ෂණය කිරීම සඳහා නිසි බලධාරියෙකු පත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා ගත් තීරණය ඉතා ප්‍රමාද වී එළඹුණු තීරණයක් වූ නිසා රාජ්‍ය මාධ්‍ය වල සමස්ථ ක්‍රියාකාරිත්වය සම්බන්ධව පැහැදිලිව විද්‍යාමාන වන බලපෑමක් කිරීමට එය අසමත් විය. පසුගිය වසරේ පාර්ලිමේන්තු මැතිවරණයේදීත් මෙය මෙසේම සිදු විය.

**මාධ්‍ය අධීක්ෂණය**

මෙම මැතිවරණ ව්‍යාපාරයේ විශාලතම ගැටළුව වූයේ මැතිවරණය ආවරණය කරන මාධ්‍යයන්ගේ අපක්ෂපාතීත්වය හා සාධාරණත්වයයි. ප්‍රධාන තරඟකාරී බලවේග දෙක අන්ත දෙකක සිටින සන්දර්භයක් තුළ රජයේ මාධ්‍ය අග්‍රාමාත්‍යතුමාට ආධාර කරන බව පුළුල් ලෙස දක්නට ලැබිණි. එහි විලෝමය වූයේ පෞද්ගලික මාධ්‍ය එ.ජා.ප. අපේක්ෂකයාට ආධාර කරන බව ඉතා පැහැදිලිව දක්නට ලැබීමයි. යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ[1] අධීක්ෂණ ක්‍රියාකාරකම් වල සොයා ගැනීම් තුළින් එම රටාව පැහැදිලිව ම සහතික කරයි.

රජයේ මාධ්‍ය තම ප්‍රවෘත්ති ප්‍රකාශනයේ දී හෝ කාලීන පුවත් ආවරණයේදී හෝ අනෙකුත් තොරතුරු සම්බන්ධ වැඩසටහන් වලදී මැතිවරණ ව්‍යාපාරය ආවරණය සම්බන්ධයෙන් සමතුලිත හා අපක්ෂපාතී වාර්තාකරණයක් සිදුකිරීමේ වගකීම ඉටු නොකළහ.

---

[1] ඔක්තෝබර් 28 දින යුරෝපීය සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ මාධ්‍ය ඒකකය මෙම මැතිවරණ ව්‍යාපාරය අධීක්ෂණය කිරීම රජයට අයත් රූපවාහිනී ආයතනය වන රූපවාහිනිය හා ස්වාධීන රූපවාහිනියත්, පෞද්ගලික රූපවාහිනි නාලිකාවක් වන ස්වර්ණවාහිනීයත් පදනම් කරගෙන සිදු කරන ලදී. එසේම දිනපතා පුවත්පත් පහක් වන රජයට අයත් ඩේලි නිව්ස් (ඉංග්‍රීසි) හා දිනමින (සිංහල) හා පෞද්ගලික දිනපතා පත්‍රයක් වන ඩේලි මිරර් (ඉංග්‍රීසි) ද අයිලන්ඩ් (ඉංග්‍රීසි) හා විරකේසරී (දෙමළ) යන පුවත්පත් ද යොදාගන්නා ලදී. මාධ්‍ය අධීක්ෂණයට ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයක් අඩංගු විය.

රජයට අයත් රූපවාහිනී මාධ්‍යය අපේක්ෂකයන්ට ලබාදුන් මැතිවරණ ආවරණයෙන් 74% (රූපවාහිනී 74% ස්වාධීන රූපවාහිනී 73%) රාජපක්ෂ මහතාට ලබාදුන් අතර 25% පමණක් වික්‍රමසිංහ මහතාට ලබා දෙන ලදී. රජයේ මුද්‍රිත මාධ්‍ය මෙයට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් තම ඉඩ ප්‍රමාණයෙන් 70% පමණ (ඩේලි නිව්ස් 73% සහ දිනමිණ 66%) රාජපක්ෂ මහතාට ලබාදුන් අතර එ.ජා.ප. අපේක්ෂකයා සන්සන්දනාත්මකව ලැබුවේ 25% කි.

පෞද්ගික රූපවාහිනී නාලිකාවක් වූ ස්වර්ණවාහිනිය මෙහි විලෝමයක් ලෙස එහි මැතිවරණ ආවරණයෙන් 66% වික්‍රමසිංහ මහතාට ද 33% එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයාට ද වෙන් කළහ. පෞද්ගලිකව අධීක්ෂණය කරන ලද දිනපතා පුවත්පත් මීට සමාන එහෙත් අඩු අවධාරණ රටාවක් සහිත විය. රනිල් වික්‍රමසිංහ මහතාට ඩේලි මිරර් පුවත්පතේ සමස්ථ ඉඩ ප්‍රමාණයෙන් 45% ද (ධනාත්මක ආවරණයක්) වීරකේසරි පුවත්පතින් 62% ද ලබා දී තිබූ අතර මහින්ද රාජපක්ෂ මහතාට ඩේලි මිරර් පුවත්පතේ 53% ද (ප්‍රධාන වශයෙන් සෘණාත්මක ආවරණයක්) වීරකේසරි පුවත්පතේ 36% ද වෙන් කර තිබිණි. අයිලන්ඩ් පුවත්පත වඩා සමබර ආවරණයක් සිදු කළේය. එහි මැතිවරණ ආවරණයෙන් 51% වික්‍රමසිංහ මහතාට ද 44% රාජපක්ෂ මහතාට ද ලබා දී තිබිණි.

යුරෝපීය සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම මැතිවරණය පැවැත්වීමට පෙර පැය 72 වූ කාලය තුළ[2] මැතිවරණ නිශ්ශබ්දතාව කඩ කිරීමේ අවස්ථා සැහෙන සංඛ්‍යාවක් පෞද්ගලික හා රාජ්‍ය ඉලෙක්ට්‍රොනික මාධ්‍යවලින් දක්නට ලැබිණ. මැතිවරණ නිශ්ශබ්දතාව සම්බන්ධ රෙගුලාසි අපැහැදිලි වූ අතර අර්ථකථන දීම සඳහා විශාල ඉඩ ප්‍රස්ථාවක් තිබුණි. ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත මාධ්‍ය සඳහා වෙනස් කාල පරාසයක් නියම කර තිබිණි.

**ඡන්ද දායකයන් ලියාපදිංචි වීම හා සර්වජන ඡන්ද අයිතිය**

මෙම මැතිවරණය සඳහා ලියාපදිංචි වූ ඡන්ද දායකයින් සංඛ්‍යාව 13,327,160 කි. මෙය පසුගිය (2004) මැතිවරණවලට වඩා 428,000 ක වැඩිවීමකි. කෙසේ වෙතත් මෙම ලේඛනය පදනම් වූයේ 2004 ජුනි මස දිවයිනේ වෙරළ සුනාමියට ගොදුරු වීමට පෙර සිදුකළ ගණනය කිරීම් පදනම් කරගෙනය. මෙම තත්ත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා හා ව්‍යාජ පුද්ගලයන් ලෙස පෙනී සිටීමේ අවස්ථාවන් අවම කිරීම සඳහා විශේෂ ක්‍රමවේදයන් ලෙස මැතිවරණ කොමසාරිස්වරයා සුනාමි නිසා මියගිය හෝ අතුරුදන් වූවන් ලෙස සැළකෙන 40,000 කගේ නම් ඡන්ද දායක නාම ලේඛනයේ සලකුණු කිරීමට පියවර ගත්තේය.

ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ අඩුපාඩු කිහිපයක් යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමට වාර්තා විය.

[2] මැතිවරණ කොමසාරිස්වරයා සඳහන් කළ පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවශ්‍යතාවයට අනුකූලව (104-17 වන සංශෝධනය හා ජනාධිපතිවරණ පනත ව්‍යවස්ථාව 117)

(අ) ඡන්ද දායකයකු ලෙස ලියාපදිංචි වීමේ අවස්ථාව ලැබුනේ ලියාපදිංචි වන දිනට (2004) වයස අවු. 18 සම්පූර්ණ වූ පුරවැසියන්ට පමණි. ඒ අතර කාල සීමාව තුළ වයස 18 සම්පූර්ණ කළ පුරවැසියන්ට තමන් ඡන්ද දායක නම් ලැයිස්තුවේ ඇතුළත් කොට නොමැති නිසා ඡන්දය භාවිතා කිරීමට නොහැකි විය.

(ආ) පවතින ආරක්ෂක තත්ත්වය හේතු කොටගෙන අසූව දශකයේ අග භාගයේ පමණ සිට උතුරු නැගෙනහිර ප්‍රදේශයේ නිවසින් නිවසට සිදු කරන ගණනය කිරීමක් සිදුකර නොතිබුණි. පසුගිය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් වාර්තා කර තිබූ පරිදි යාපනය දිස්ත්‍රික්කයේ ලියාපදිංචි වී සිටි ඡන්ද දායකයින් සංඛ්‍යාව (701,938) එහි සිටින නේවාසිකයන් සංඛ්‍යාව හා සම නොවේ. (මෙයින් අඩකඩත් වඩා අඩුවිය හැකි බවට ගණන් බලා ඇත.)

(ඇ) දිස්ත්‍රික්ක අතර සිදුවිය හැකි ද්විත්වවීම් වැලැක්වීම සඳහා මධ්‍යම මට්ටමේදී කිසිදු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීය. මෙම ද්විත්ව වීම් මකා දමන ලද්දේ සිද්ධියෙන් සිද්ධියට අනුව එක් එක් පුද්ගල පැමිණිලි පදනම් කරගෙනය. මැතිවරණ කොමසාරිස්වරයා ඇස්තමේන්තු කළ පරිදි එසේ ද්විත්ව වූ ප්‍රමාණය 30,000 පමණ විය.

(ඈ) සුනාමියට ගොදුරු වූ ප්‍රදේශවල ඇස්තමේන්තු කර ඇති පරිදි පුද්ගලයෝ 440,000 පමණ අවතැන් වී සිටිති. කෙසේ වෙතත් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් සාමාන්‍යයෙන් ඔවුන්ගේ දිස්ත්‍රික්කයේ ජීවත්වන අතර ඔවුන් පෙර ජීවත් වූ ස්ථානයට කිලෝ මීටර කීහිපයක් නුදුරින් ජීවත්වන බවට වාර්තා වී ඇත. මැතිවරණ කොමසාරිස්වරයා අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ නව වාසස්ථාන පිළිබඳව හඳුනාගන්නා ලෙසට ග්‍රාම නිලධාරිවරයාට උපදෙස් ලබා දුන්න ද, වාර්තා වී ඇති පරිදි සැලකිය යුතු සංඛ්‍යාවක් ඡන්ද දායකයින්ගේ පත්‍රිකා රටේ නැගෙනහිර පළාත තුළ බෙදා දී නොමැත. ඡන්දය දැමීම සඳහා ඡන්ද කාඩ්පත අනිවාර්ය නොවන බව නොදත් සමහර ඡන්ද දායකයන්ට තම ඡන්දය දැමීමේ අවස්ථාව අහිමි වූවා යයි හැඟෙන්නට ඇත.

(ඉ) යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමට වාර්තා ලැබී ඇති පරිදි මිලියන 1.5 පමණ ශ්‍රී ලාංකික පිරිසක් විදේශයන්හි ජීවත් වූවත් ඔවුන් බහුතරයක් ඡන්ද දායක ලැයිස්තුවට ඇතුළත් කර ඇත. මැතිවරණ දිනයකදී ඡන්දය දැමීමට ඔවුන්ට පැමිණීමට හැකිවේද යන්න සැක සහිතය. මැතිවරණ දිනයේදීත් ඔවුන්ගේ නම් එම ලැයිස්තුවේ තිබීමේ හේතුව වන්නේ විදේශගතව සිටින පුද්ගලයන් පිළිබඳ දත්ත මැතිවරණ පරිපාලනයට ලබා දීමට රැකියා කාර්යාංශය අපොහොසත් වීමයි. මෙම ගැට ව සම්බන්ධයෙන් ඉදිරි සති වලදී යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම වැඩිදුර සොයා බලනු ඇත.

**ශ්‍රේෂ්ඨාධිකරණය - නොවැම්බර් 9 අතුරු නියෝගය හා ඡන්ද දායකයන්ට සමානව සැලකීම**

අපේක්ෂකයන් දෙදෙනෙකු[3] විසින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ පෙත්සම සලකා බැලීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය නොවැම්බර් 9 වන දින අතුරු නියෝගයක් පනවන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළ නව විධිවිධාන වලට අනුව උතුරු නැගෙනහිර ප්‍රදේශයේ පොකුරු ඡන්ද මධ්‍යස්ථාන වලට පමණක් එය අදාළ විය. මෙම අතුරු වාර්තාව මගින් ශ්‍රී ලංකා හමුදාව සිටින සීමාවේ සිට ඡන්ද මධ්‍යස්ථානය වෙත වූ මීටර් 500 දුර ප්‍රමාණයට තවත් අමතර මීටර් 500 ක අමතර දුරක් එක් කළ අතර ඡන්ද දායකයන්ට ඡන්දය දෙන ස්ථානයට ළඟා වීම සඳහා කොටස් දෙකකින් ප්‍රවාහන පහසුකම් සලසා දී තිබුණි. මෙම විධිවිධානය සඳහා වූ හේතුව වූයේ එල්. ටී. ටී. ඊ. පාලන ප්‍රදේශ වල ඡන්ද ව්‍යාපාරය සිදු නොකළ නිසා ඡන්ද දායකයන් ඡන්ද පොළට පැමිණීමට පෙර අපේක්ෂකයන්ට ඒ සඳහා අවස්ථාව සලසා දීමයි. විවිධ අවස්ථාවන් යටතේ මෙම නව ක්‍රියාමාර්ගය මගින් ඡන්ද දායකයින්ගේ බාධා රහිත වූ ගලා යාමට යම් බලපෑමක් ඇතිවීමේ හැකියාව තිබිණි. මෙහි දී මතුකළ යුතු ප්‍රධාන කාරණය වන්නේ මැතිවරණ දිනයක මූලික කාරණය වන්නේ ඡන්දය ප්‍රකාශ කිරීම මිස මැතිවරණ ව්‍යාපාරයෙහි යෙදීම නොවේ.

2004 මැතිවරණයේදී වාර්තා වූ පරිදි ව්‍යාජ පුද්ගලයන් ලෙස පෙනී සිටීම වැලැක්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සහා ප්‍රශ්න ඇසීමට හා ඡන්ද දායකයාට නොහැකි වූ අවස්ථාවකට ඔහුට / ඇයට ඡන්දය ප්‍රකාශ කිරීමට ඉඩ නොදීම සඳහා ඡන්ද ස්ථානාධිපතිට නව බලතල ලබා දී ඇත.

යම් කිසි පුද්ගලයෙක් අනන්‍යතාව සම්බන්ධයෙන් හෝ වයස සම්බන්ධව අසත්‍ය ප්‍රකාශයක් කළ බවට ඡන්ද ස්ථානාධිපතිට සැක පහළ වූ විට පුද්ගලයා සාමාන්‍ය ක්‍රියාවලියට හා නීතියේ සම්බාධක වලට යටත් නොවන විට නිවාරණීය රඳවාගැනීමක් සඳහා නව බලයක් සහිත ක්‍රියාමාර්ග අතුරු වාර්තාව මගින් ස්ථාපිත කර ඇත. මෙය පාර්ලිමේන්තුවට පමණක් පවරා ඇති "ජනාධිපතිවරණයේ ක්‍රියාමාර්ගය සඳහා හා එහිදී භාවිතා කිරීමට ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීමටත්" හා "එවන් මැතිවරණ වලට අදාළ වැරදි ඇතිකිරීම හා ඒ සඳහා දඬුවම් ලබාදීමත්" යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 ව්‍යවස්ථාව (6b/c) හා පරස්පර විරෝධී නොවේ. අවසාන වශයෙන් මෙසේ තමාට අවුරුදු 18 ට වඩා යයි තහවුරු කිරීමට නොහැකි වූ ලාබාල වැඩිහිටියකු රඳවා ගැනීම, එක දිනකට පමණක් සිදුකළ ද එය වරදක් කිරීමට තැත් කිරීම සමඟ සමානුපාතික නොවේ.

මෙම නියෝගයත් සමඟ ශ්‍රේෂ්ඨාධිකරණය, පවතින නීතිමය රාමුව අභිබවා ගොස් ඇත. මෙම තීරණය මගින් ශ්‍රී ලංකා පුරවැසියන් අතර නීතිය දෙයාකාරයකට ක්‍රියාත්මක කිරීමක් සිදු වී ඇති අතර එය අනාගතයේදී සාකච්ඡා කළ යුතු කාරණයකි. තවදුරටත් යුරෝපීය සංගමයේ

---

[3] නෙල්සන් පෙරේරා - ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ හා විමල් ගීගනගේ, ශ්‍රී ලංකා ජාතික පෙරමුණ.

මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම මූලික නිදහසට ප්‍රතිවිරෝධයන් ලෙස නිදහස ප්‍රතික්ෂේප කිරීම, ආධාරක යාන්ත්‍රණයට ළඟාවීමේ අපහසුතාව, ක්‍රියාවෙන් ඇඟවෙන වරද පිළිබඳ අනුමානය සලකනු ලබයි.

**මැතිවරණ නීතියේ විස්තර කර ඇති පරිදි මැතිවරණය පැවැත්වීම හා ඡන්ද ගණන් කිරීම**

(අ) තැපැල් ඡන්ද යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම නොවැම්බර් 7 හා 8 දිනයන් හි තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම නිරීක්ෂණය කළේය. 2004 දී මෙන් ක්‍රියාපරිපාටින් ඉතා හොඳින් පිළිපදින ලදී. ද්‍රව්‍යයන් අස්ථානගත වූ අවස්ථා කිහිපයක් අවධානයට පාත්‍ර වූ අතර, නිරීක්ෂණය කරන ලද ඡන්ද මධ්‍යස්ථාන වලින් 8% දී පමණ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍ය බව සෑම පියවරකදීම ආරක්ෂා කොට නොතිබිණි. (ඒ ප්‍රධාන වශයෙන් ම ඡන්ද දායකයන්ට තම ඡන්දය රහසේ සැලකුණු කිරීමට අවස්ථාව සලසා නොතිබූ නිසාය.)

තැපැල් ඡන්ද සඳහා ඉදිරිපත් කළ ඉල්ලුම්පත් විශාල සංඛ්‍යාවක් (17% පමණ) ප්‍රාදේ· ය විෂමතා සහිතව (උදා : නුවරඑළියෙහි 23% පමණ) ප්‍රතික්ෂේප වූ බවට යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමට දැනුම් දෙනු ලැබීය. මෙයට ප්‍රධාන හේතු දෙකක් මැතිවරණ පරිපාලනය මගින් සඳහන් කරන ලදී. එකක් නම් ඡන්ද දායකයා තම අයදුම්පත්‍රය කලට වේලාවට ඉදිරිපත් කර නොතිබීම හෝ ඡන්ද දායකයා එම ආකෘතිය නිසි ආකාරයෙන් සම්පූර්ණ කර නොතිබීමයි. යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම ඉදිරි සතිවලදී මෙම ගැට ව සම්බන්ධයෙන් සලකා බලනු ඇත.

(ආ) මැතිවරණ දිනය හා ගණන් කිරීම.

එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවල හා උතුරු නැගෙනහිර දෙමළ ජනතාව වෙසෙන හමුදා පාලන ප්‍රදේශවලත් ඡන්ද දායකයින්ගේ සහභාගිත්වය ඉතා අවම මට්ටමක පැවතුණි. මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයෝ මෙය වව්නියාව, ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වල නිරීක්ෂණය කළහ. එය නොවැම්බර් 10 දින එල්.ටී.ටී.ඊ. සංවිධානය හා ටී.එන්.ඒ.[4] සංවිධානයේ ඒකාබද්ධ ප්‍රකාශය වන "මැතිවරණ සම්බන්ධයෙන් කිසිදු උනන්දුවක් දැක්වීම ඵල රහිත ක්‍රියාවකි" යන්න පදනම් ව සිදුවිය. මෙය එම ප්‍රදේශයේ ඡන්ද දායකයන් තුළ බියක් හා අස්ථිරත්වයක් ඇති කිරීමට හේතු විය. සත්‍ය වශයෙන් සිදුවිය යුතු යයි එල්.ටී.ටී.ඊ. සංවිධානය අපේක්ෂා කළ දෙය පිළිබඳව අපැහැදිලි බවක් ඇති නොවීම සඳහා ඔවුහු ප්‍රචණ්ඩත්වය හා බිය වැද්දීම් සුලභ පරිසරයක් නිර්මාණය කරමින් මෙම වර්ජනය සඳහා

[4] දෙමළ ජාතික සංවිධානය

බල කර සිටියහ. තවදුරටත් එල්.ටී.ටී.ඊ. හි ඉදිරිපෙළ සංවිධාන කිහිපයක් මැතිවරණ දිනයේදී මැතිවරණ කාර්ය මණ්ඩලයට වැඩ නතර කිරීමටත් එය "ශෝක" දිනයක් බවට පත් කිරීමත් සඳහා වර්ජනයක් කිරීමටත් පැහැදිලි ප්‍රකාශයක් නිකුත් කළහ. මඩකලපුවේ දෙමළ ජනයා ජීවත් වන ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය වර්ධනය වන ආකාරයක් යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම නිරීක්ෂණය කළ අතර අත්බෝම්බ එල්ල කිරීමේ සිද්ධි හතක් ද ඡන්ද මධ්‍යස්ථාන, ප්‍රධාන දිස්ත්‍රික්ක වල ඡන්ද ගණන මධ්‍යස්ථාන, එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවල සිට ඡන්ද දායකයන් ප්‍රවාහනය කළ බස් රථයක් හා පොලිස් පරීක්ෂණ ස්ථානයක් ආදිය ඉලක්ක කොටගත් බෝම්බ ප්‍රහාර ද දක්නට ලැබුණි. යාපනය, වව්නියාව හා මඩකලපුව නිරීක්ෂකයන් පාලන සීමාවන්හි සාමාන්‍ය ඇඳුමින් සැරසුණු කණ්ඩායම් දක්වන විරෝධතා ද ඡන්ද කාඩ්පත් පිලිස්සීම ද නිරීක්ෂණය කළහ. යාපනය හා මඩකලපුව ප්‍රදේශයේ රජයේ පාලන ප්‍රදේශවල ද හිස් මාවත් නිසා ආතතියක් සහිත පරිසරයක් නිර්මාණය වී තිබුණ බව වාර්තා විය.

අනෙකුත් සියලුම ප්‍රදේශවල නොවැම්බර් 17 දින ඡන්දය පැවැත්වීම හා ගණන් කිරීම විධිමත් ආකාරයකට සිදුවිය. යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම දිස්ත්‍රික්ක 22 පුරාම ඡන්ද මධ්‍යස්ථාන හා ගණන ස්ථාන නිරීක්ෂණය කළේය. මැතිවරණ දිනය පිළිබඳ සමස්ත දර්ශනය හොඳින් පරිපාලිත ක්‍රියාවලියක් හා විශාල සංඛ්‍යාවලින් ඡන්ද දායක සහභාගිත්වයක් ද සහිත විය. යුරෝපා සංගමයේ නිරීක්ෂකයෝ නිරීක්ෂණය කරන ලද ස්ථාන 330 ට වැඩි ප්‍රමාණයක් මැතිවරණ ක්‍රියාවලිය හොඳ හෝ 96% තරම් ප්‍රමාණවත් යයි තක්සේරු කළහ. නිරීක්ෂණය කරන ලද ඡන්ද මධ්‍යස්ථාන සියල්ලෙන්ම 4% ක පමණ ප්‍රචාරක ද්‍රව්‍යය ඡන්ද මධස්ථානයට මීටර් 50 පමණ දුරින් දක්නට ලැබිණි. පරීක්ෂා කළ සියලුම මධ්‍යස්ථාන වල ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාවලිය හොඳ හෝ ප්‍රමාණවත් තත්ත්වයක තිබූ බවට තක්සේරු කර ඇත.

නැරඹූ සියලුම ඡන්ද ස්ථානවල (89%) ඡන්ද ස්ථාන නියෝජිතයින් පැමිණ සිටීම ධනාත්මක විනිවිද භාවය පිළිබඳ ක්‍රියාමාර්ගයක් විය. නරඹන ලද ඡන්ද මධ්‍යස්ථාන 73% ක දේශීය නිරීක්ෂකයෝ සහභාගි වී සිටියහ. නිරීක්ෂණය කරන ලද ඡන්ද ගණන මධ්‍යස්ථාන 88% ක ඡන්ද ස්ථාන නියෝජිතයෝ දක්නට සිටියහ.

සෑම ඡන්ද දායකයකුගේම ලියාපදිංචි අංකය ඡන්ද පිළිපතෙහි සටහන් කිරීම නිසා සියලුම සලකුණු කරන ලද ඡන්ද හඳුනාගත හැකිවිය. මෙය වංචාවන් වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් වුවද එය මූලික වශයෙන් ඡන්දයේ රහස්‍ය භාවය අවතක්සේරු කරයි.

නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි ඡන්දය දැමීමේ කුටි පිහිටුවා තිබූ ආකාරයට මැතිවරණ නිලධාරින්ට ඡන්ද දායකයන් තම ඡන්දය සලකුණු කිරීම දැක ගැනීමට හැකි තත්ත්වයක් තිබුණි. මැතිවරණ වංචා කිරීමට දරන උත්සාහයන් වැලැක්වීම මෙහි අරමුණ විය හැකි නමුත් එමගින් ඡන්දයේ රහස්‍ය බවට බලපෑමක් එල්ල විය. නිරීක්ෂණය කරන ලද ඡන්ද මධ්‍යස්ථාන 75% ක

පමණ සැකස්ම ප්‍රමාණවත් නොවන බවට තක්සේරු කරන ලදී. මෙය මීට පෙර වූ යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම විසින් ද හඳුනාගෙන තිබිණි.

ඡන්ද දායකයින්ට යම් කිසි අනන්‍යතාවක් හෝ ඡන්ද කාඩ්පතක් ඉදිරිපත් කිරීම සඳහා බැඳීමක් නොමැති වීමේ නෛතික අඩුපාඩුව ව්‍යාජ පුද්ගලයන් ලෙස පෙනී සිටීමේ හා බහු ඡන්ද ප්‍රකාශ කිරීමේ උත්සාහයයන්ට එරෙහි දුර්වල ආරක්ෂාවක් සපයයි. මෙම කාරණා සම්බන්ධව ඡන්ද ස්ථානාධිපතිගේ වියුක්ත වීම ජනතාවගේ ඡන්ද බලය අහෝසි වීමට හේතු විය හැකිය. නරඹන ලද ඡන්ද මධ්‍යස්ථාන වලින් 4% ජනතාවට තම අනන්‍යතාව තහවුරු කළ නොහැකි වූ නිසා ඡන්දය දිම ප්‍රතික්ෂේප වීම දක්නට ලැබුණි. 9% පමණ ඡන්ද මධ්‍යස්ථානවල යම් යම් ඡන්දදායකයන්ගේ අනන්‍යතාව පිළිබඳ විරෝධය මතුවිය. 2000, 2001 හා 2004 යන වසරවලදී යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම නිල අනන්‍යතාවක අවශ්‍යතාව නිර්දේශ කොට ඇත.

ද්විත්ව ඡන්ද ප්‍රකාශ කිරීම වැලැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග සමහර සිද්ධින්හි ද දුර්වල ලෙස යොදාගන්නා ලදී. තීන්ත නිරන්තරයෙන් ම ආලේප කළත් ඡන්ද මධ්‍යස්ථාන 9% පමණ ඡන්දය නිකුත් කිරීමට පෙර තීන්ත පිළිබඳව සොයා නොබලන ලදී. තීන්ත පිළිබඳ පරීක්ෂා කිරීමේදී ත්‍රිකුණාමලය, මඩකලපුව හා කෑගල්ල ප්‍රදේශයන්හි නිරීක්ෂණය කළ පරිදි එම තීන්ත දර්ශනය වීම පැයකටත් වඩා අධික කාලයක් ගතවීම සිදුවිය. නරඹන ලද ඡන්ද මධ්‍යස්ථාන 3% පමණ ද්විතීක ඡන්ද පත්‍රිකා නිකුත් කරන ලදී. (මේවා නිකුත් කරන්නේ යම් පුද්ගලයෙකු යම් පුද්ගලයෙකුගේ නම වෙනුවට ඡන්දය ප්‍රකාශ කළ අවස්ථාවකදීය.) විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඡන්දය දෙන ස්ථාන කිහිපයක විශාල වශයෙන් හමුදාව හා පොලීසිය සිටිනු දක්නට ලැබිණි. ඇත්ත වශයෙන් ම විභව්‍ය ආතතියක් සහිත පරිසරයක මෙමගින් ආරක්ෂාවක් සැපයෙන්නේ වුව ද එමගින් ඡන්ද දායකයන් මත යම් කිසි බියවැද්දීමක් වැනි බලපෑමක් සිදුවීමට ඉඩ ඇත.

කොළඹ දිස්ත්‍රික්කයෙන් නිරන්තරයෙන් ලැබුණු වාර්තාවලින් පැහැදිලි වූයේ පුද්ගලයන් සැහෙන සංඛ්‍යාවකගේ නම් ඡන්ද දායක ලැයිස්තුවේ නොතිබූ බවයි. තමන් එම ස්ථානයේ ලියාපදිංචි වූ බවත් තම අසල්වැසියන් ද ලියාපදිංචි කළ බවත් ඔවුන් ලියාපදිංචි කරගෙන නොමැත්තේ ඇයි ද යන්නත් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වන්නේ කෙසේද යන්නත් තමන් නොදන්නා බවට ඔවුහු චෝදනා කළහ. ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතා නිසා ඡන්ද අයිතිය අහිමිවීම මෙන්ම මහජන කලකිරීම ද ඇති වේ.

<u>මැතිවරණයේදී අත්‍යවශ්‍ය නිදහස හා සාධාරණත්වයට අදාළ අනෙකුත් ගැටළු</u>

**පොලිසිය**

මෑතකදී පැවැත් වූ අන් මැතිවරණවලට වඩා මැතිවරණ ව්‍යාපාරයේදී හා මැතිවරණ දිනයේදී පොලිසියේ කටයුතු වඩා යහපත් තත්ත්වයක පැවැතුණි. මැතිවරණ ව්‍යාපාරය තුළ දී පෝස්ටර් හා පක්ෂ ලකුණු ප්‍රදර්ශනය තහනම් කිරීම පොලිසිය විසින් කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ අතර එමගින් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සැහෙන ප්‍රමාණයකින් පහත වැටුණි. මෙය සමස්ත රට පුරාම යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමට වාර්තා විය. කෙසේ වෙතත් පොලිස්පතිතුමා හා නියෝජ්‍ය පොලිස්පතිතුමා (පසුගිය යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් වලට සාපේක්ෂව) මැතිවරණ වලට අදාළව ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ සංඛ්‍යාලේඛන ලබාදීමට එකඟ නොවීම පිළිබඳව යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම තම කනගාටුව ප්‍රකාශ කරයි.

**ඡන්ද දායකයාගේ අධ්‍යාපනය**

මාධ්‍යවල ඡන්ද දායකයාගේ අධ්‍යාපනය ඉතා අඩු හා ප්‍රමාණවත් නොවන මට්ටමක තිබුණි. විද්‍යුත් මාධ්‍යවලට මෙය විශේෂ විය. මනාප ඡන්ද ක්‍රමයේ සංකීර්ණතා පිළිබඳ සලකා බැලීමේ දී ඡන්ද දායකයාගේ දැනුවත් බව මෙම මැතිවරණයේදී ඉතා වැදගත් වේ. මාධ්‍ය සඳහා මැතිවරණ කොමිසම ලබාදුන් නිර්ණායකයන් ඡන්ද දායකයා දැනුවත් කිරීම සඳහා කිසිදු විධිවිධානයක් සඳහන් කිරීමට අපොහොසත් විය.